රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි**

**GEO 42623 – දක්ෂිණ ශ්‍රී ලංකාවේ භූගෝලීය පැතිකඩ**

**<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**කාලය : පැය 03 යි.**

---

01. "දක්ෂිණ ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක ව්‍යුහය පෘථිවි භූ විද්‍යාත්මක ඉතිහාසය තුළ අවසන් යුගවල සැකසුණු සාක්ෂි මත ගොඩනැගී තිබේ." යන ප්‍රකාශය හා ඔබ එකඟ වන්නෙහි ද? විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

(ලකුණු 15)

02. "ශ්‍රී ලංකාවේ භූ රූප විද්‍යාත්මක ලක්ෂණවල සහ ක්‍රියාවලිවල විවිධතාව අධ්‍යයනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය ආදර්ශක කලාපය දක්ෂිණ ශ්‍රී ලංකාවයි." යන ප්‍රකාශය උචිත ක්ෂේත්‍රීය නිදසුන් ඇසුරින් විභාග කරන්න.

(ලකුණු 15)

03. දක්ෂිණ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කෘෂි කර්මාන්ත හා ධීවර කර්මාන්ත ක්ෂේත්‍රයන් වැදගත් වන අයුරු දක්වා, එම ක්ෂේත්‍රවල දක්නට ලැබෙන ගැටලු සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

04. 'වෙරළ' හා 'වෙරළ කලාපය' යන්න අර්ථ දක්වා, දක්ෂිණ ශ්‍රී ලංකාවේ වෙරළ සම්පත් භායනය කෙරෙහි මානව ක්‍රියාකාරකම් හි බලපෑම නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

05. දක්ෂිණ ශ්‍රී ලංකාවේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ වරාය ඉදිකිරීම නිසා සිදුව ඇති සමාජ - ආර්ථික ප්‍රතිලාභ විමර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

06. දක්ෂිණ ශ්‍රී ලංකාවේ පාරිසරික සංචාරක කර්මාන්තයට (Eco Tourism) සුවිශේෂී ස්ථානයක් ලබාදීමට ගතික සංස්කෘතික පරිසරය කෙතරම් සමත් වන්නේ ද යන්න පරීක්ෂා කරන්න.

(ලකුණු 15)

07. "ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි එම ප්‍රදේශයේ මානව සම්පත සුවිශේෂී සාධකයක් වේ." ශ්‍රී ලංකාවේ දක්ෂිණ ප්‍රදේශය ඇසුරින් මෙම ප්‍රකාශය විමර්ශනය කරන්න.

(ලකුණු 15)

@@@@@@@@@@@@@@@@